ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2123/50 - 2019 මැයි මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2019.05.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත

2019 වර්ෂය සඳහා ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන කටයුතු 2019 මැයි මස 15 වන දින ආරම්භ කර ඇති බව 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 12(1) වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. දැනට වලංගුව පවතින ඡන්දහිමි නාමලේඛනවල හෝ ඒවායේ කොටස්වල පිටපත් ලියාපදිංචි කිරීමේ නිලධාරීන් විසින් ස්වකීය කාර්යාලවල දී සහ පහත දැක්වෙන කාර්යාලවලදී ප්‍රදර්ශනය කරනු ඇත.

| *නාමලේඛනවල හෝ ඒවායේ කොටස්වල පිටපත් ප්‍රදර්ශනය කරනු ලබන කාර්යාල* | *ප්‍රදර්ශනය කරනු ලබන නාමලේඛන හෝ ඒවායේ කොටස්* |
|---|---|
| එක් එක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛනයේ සම්පූර්ණ පිටපත |
| එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පදිංචිව සිටින සාමාන්‍ය පදිංචිය සනාථවන ඡන්දහිමියන්ගේ නම් ඇතුළත් ඡන්දහිමි නාමලේඛන කොටස, |
| එක් එක් පළාත් පාලන ආයතනය | එක් එක් පළාත් පාලන ආයතනයේ බල ප්‍රදේශය තුළ සාමාන්‍ය පදිංචිය සනාථවන ඡන්දහිමියන්ගේ නම් ඇතුළත් ඡන්දහිමි නාමලේඛන කොටස, |
| එක් එක් ග්‍රාම නිලධාරි කාර්යාලය | අදාළ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ සාමාන්‍ය පදිංචිය සනාථවන ඡන්දහිමියන්ගේ නම් ඇතුළත් ඡන්දහිමි නාමලේඛන කොටස, |

03. යම් මැතිවරණ කොට්ඨාසයක ඡන්දහිමියකු වීමට සුදුසුකම් ඇති සෑම තැනැත්තෙකුටම සිය නම වලංගු ඡන්දහිමි නාමලේඛනයේ තිබේදැයි පරීක්ෂා කර බැලීමට ක්‍රියා කළ යුතු වේ.

04. 2019 වර්ෂය වෙනුවෙන් ඡන්දහිමියන් වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් ඇති පුද්ගලයන්ගේ විස්තර ලබා ගැනීම සඳහා ඡන්දහිමියන් ගණන් ගන්නා නිලධාරීන් විසින් ගෘහ මූලිකයන් වෙත අදාළ ආකෘති පත් 2019.05.15 වන දින සිට නිකුත් කරනු ලැබේ. ගෘහ මූලිකයින් විසින් සම්පූර්ණ කරනු ලබන ආකෘතිපත් ආපසු එකතු කිරීමේ කටයුතු 2019 ජූනි මස 01 දින සිට සිදු කරනු ලැබෙනු ඇත. ස්වකීය ගෘහය යටතේ ඡන්දහිමියන් වශයෙන් ලියාපදිංචි වීමට සුදුසුකම් ලබන සියළු දෙනාට අදාළ නිවැරදි විස්තර අප්‍රමාදව සපයා දීමෙන්, ඡන්දහිමියන් ගණන් ගන්නා නිලධාරීන්ට ගෘහ මූලිකයන්ගේ සහාය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

| | | |
|---|---|---|
| මහින්ද දේශප්‍රිය<br>සභාපති<br>මැතිවරණ කොමිෂන් සභාව | එන්. ජේ. අබේසේකර<br>සාමාජික<br>මැතිවරණ කොමිෂන් සභාව | එස්. රත්නජීවන් එච්. හූල්<br>සාමාජික<br>මැතිවරණ කොමිෂන් සභාව |

2019 මැයි මස 16 වැනි දින,
සරණ මාවත, රාජගිරිය,
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.

1A - G 30076 — 57 (2019/05)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*